මගේ අංකය : පුවි/1/17/ස.ආ/බ.ගැ (වි.සේ.)

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,

කොළඹ 07.

2016.09.28

ප්‍රධාන කාර්යාලයේ සියලුම අධ්‍යක්ෂ / ප්‍රධාන ගණකාධිකාරී,

සියලුම සහකාර අධ්‍යක්ෂ / ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ,

සියලුම ඒකක ප්‍රධානීන් වෙත.

**<u>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) තනතුර පිරවීම සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවීම.</u>**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) තනතුර පිරවීම සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ පිටපතක් සහ අදාළ අයදුම්පත්‍රයේ පිටපතක් මේ සමඟ ඔබ වෙත එවමි.

02. එ අනුව එම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔබ කාර්යාලයේ / අංශයේ සියලු නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, අදාළ සුදුසුකම් සහිත නිලධාරීන්ගේ අයදුම්පත්‍ර 2016.11.04 දින හෝ ඊට පෙර මා වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත්, ඔබ අංශයේ / ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ මෙම දැන්වීම ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

මහාචාර්ය සෙනරත් දිසානායක

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

**මහාචාර්ය සෙනරත් දිසානායක**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පිරවිය යුතු ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) තනතුරෙහි පුරප්පාඩු පිරවීම.**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2016.04.30 දිනට පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටියෙහි 7.3.4. හා 7.3.4.1 වගන්ති අනුව පවත්වන තරඟ විභාගය සඳහා පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2016.11.04 දිනට හෝ ඊට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙලවරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) තනතුර සඳහා වන බඳවාගැනීමේ තරඟ විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි හානිය අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. **සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:**

ලිඛිත විභාගය සමත් අදාල සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව මෙම තනතුරට බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේ දී අපේක්ෂිතයන් හට ලබාදුන් ලකුණු ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු වලට එකතු කල විට ලැබෙන මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනේ.

මෙම තනතුරට පත්කිරීම හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන වලට හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර 05 ක් තුලදී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය/වැඩ බැලීමේ කාලය තුලදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීනතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය වසර පහක (05) ක් තුළ ලබාගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, අංක 1877/27 දරණ 2014 අගොස්තු මස 28 දින ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි වලට ද, මෙම පත්වීම යටත් වේ.

3. **මාසික වැටුප් පරිමාණය :**

2016.02.25 දිනැති අංක 03/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු: 47,615- 10x1335- 8x1630- 17x2170- රු: 110,895/= (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව උපලේඛන II හි සඳහන් පරිදි වේ.

4. **සුදුසුකම් :**

4.1 **අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

4.2 **පළපුරුද්ද :**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන පන්තියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියෙකු වීම හෝ විශේෂ පන්තියේ නිලධාරියෙකු වීම.

5. **කායික සුදුසුකම් :**

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6. වෙනත් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තරඟ විභාගයකට දෙවතාවකට වඩා පෙනී නොසිටීම.

iv. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ අයකු නොවීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දාතම දරණ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ සඳහන් කරුණු අනුව නුසුදුස්සකු නොවීම.

vi. අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

7. ලිඛිත විභාගය

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 % | 40% |
| 2. බුද්ධි පරීක්ෂණය | පැය 02 | 100 % | 40% |

**විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | තනතුරෙහි ක්ෂේත්‍රයට අදාළව දෙපාර්තමේන්තුවේ තිබෙන්නා වූ විශේෂිත කාර්යයන් පිළිබඳව දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, කාර්යය භාරය සහ සාමාන්‍ය පරිපාලනය පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.<br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය : බහුවරණ, කෙටි ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විත විය හැක. |
| 2. බුද්ධි පරීක්ෂණය | I වන කොටස : සියළුම විෂයයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.<br>II වන කොටස : ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සහ කලාව යන විෂයයන්ද දේශීය හා විදේශීය කාලීන තොරතුරු සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලින් සමන්විත වේ.<br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය : ඉහත ප්‍රශ්න පත්‍ර බහුවරණ, කෙටි ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හෝ ඒවායේ සංකලනයෙන් යුක්ත විය හැක. |

8. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | පශ්චාත් උපාධිය සඳහා | 20 | 40 |
| | පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා | 18 | |
| | (පශ්චාත් උපාධි සුදුසුකම සඳහා . උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | | |
| | විශේෂ උපාධිය | | |
| | - පළමු පන්තියේ සමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සමාර්ථයක් සඳහා | 18 | |
| | - දෙවන පන්තියේ පහළ සමාර්ථයක් සඳහා | 16 | |
| | සාමාන්‍ය උපාධිය | | |
| | - පළමු පන්තියේ සමාර්ථයක් සඳහා | 18 | |
| | - දෙවන පන්තියේ ඉහළ සමාර්ථයක් සඳහා | 16 | |
| | - දෙවන පන්තියේ පහළ සමාර්ථයක් සඳහා | 12 | |
| 02 | අතිරේක පළපුරුද්ද | | 35 |
| | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I පන්තියේ නිලධාරියෙකු ලෙස පළපුරුද්ද | | |
| | (මූලික සුදුසුකම් සඳහා අවශ්‍ය වන වසර 05 ක සේවා කාලය හැර අතිරේක සේවා කාලයට පමණක් ලකුණු ලබා දේ.) | | |
| | මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු | 02 | |
| | එක් අවුරුදු කාල සීමාවක් සඳහා | 05 | |
| 03 | භාෂා ප්‍රවීණතාවය | | 10 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා | 10 | |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාල ක්ෂේත්‍රය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසරකට නොඅඩු හෝ පැය 1500කට නොඅඩු ) | 05 | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොඅඩු හෝ පැය 720 කට නොඅඩු) | 03 | |

| | | | |
|---|---|---|---|
| 4 | පරිගණක හැකියාව<br>තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයන් ලෙස හදාරා ඇති උපාධියක් සඳහා<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයකින් ලබා ඇති තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(වසරකට නොඅඩු හෝ පැය 1500කට නොඅඩු )<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(මාස 06 කට නොඅඩු හෝ පැය 720 කට නොඅඩු) | 10<br>05<br>03 | 10 |
| 5 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය සඳහා | | 05 |

9. විභාග කොන්දේසි :

I. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පෙනී සිටිය යුතුය. අපේක්ෂකයන්ට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

II. විභාග ගාස්තුව රු.1000/= කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි ආරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

විභාගය සඳහා ගෙවන මුදල් ගාස්තු කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන : ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කලයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A 4 කඩදාසි වල සකස් කළ යුතු අතර, ශීර්ෂ අංක 1.0 සිට 6.5 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, 7.0 සිට ඉදිරියට ඇති ශීර්ෂ පිළිවෙලින් අනෙක් පිටුවටද ගෙන සකස් කලයුතු අතර, එය මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස් කල යුතුය. ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කල යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාල ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි.

සටහන : ඔබගේ පහසුව සඳහා නිවැරදිව සකස් කරන ලද විභාග අයදුම් පත්‍රය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් www.archaeology.gov.lk බාගත කළ හැක.

ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ විහාම පුවත්පත් වල නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ලඟ තබාගෙන, නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඩුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

අපේක්ෂකයාගේ අනන්‍යතාවය : විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර තිබිය යුතුය. පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

අපේක්ෂකයාගේ අනන්‍යතාවය : විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර තිබිය යුතුය. පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

සැලකිය යුතුය : අ. අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

ආ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

අයදුම්කරුවන් සිය අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කල යුතුය.විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන සහතික කර ගැනීම අනිවාර්ය වේ. එහිදී අයදුම්කරුවන් සිය අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා ලවා හෝ රජයේ පාසල් ප්‍රධානියෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරියෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.240,360/- ක් හෝ ඊට ඉහළ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරණ අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**මහාචාර්ය සෙනරත් දිසානායක**
**පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්**
**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**
**කොළඹ 07.**

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ

(රසායන සංරක්ෂණ) තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2016

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2

දෙමළ - 3

ඉංග්‍රීසි - 4

1.0 1.1 මුලකරු අගට යොදා මුලකුරු සමඟ නම : ..........................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) උදා : PERERA, A.B.C.

1.2 මුලකරු අගට යොදා මුලකුරු සමඟ නම : ..........................................................

(සිංහලෙන්/දෙමළෙන්) උදා : පෙරේරා ඒ.බී.සී.

1.3 සම්පූර්ණ නම : ..........................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

1.4 සම්පූර්ණ නම : ..........................................................

(සිංහලෙන්/දෙමළෙන් )

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය : ..........................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

2.2 ස්ථිර ලිපිනය : ..........................................................

(සිංහලෙන්/දෙමළෙන් )

3.0

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0

(අදාළ කොටුව තුළ ලියන්න.) ස්ත්‍රී - 1

3.2 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.3 2016.11.04 දිනට වයස : අවුරුදු මාසය දිනය

4.0 අධ්‍යාපන සුදුසුකම් :

| උපාධි පාඨමාලාව | විශ්ව විද්‍යාලය | වර්ෂය | පන්ති සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

5.0 පළපුරුද්ද :

..........................................................

..........................................................

6.0 රාජ්‍ය සේවයේ නියුතු වුවකු නම්,

6.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය : ..........................................................

6.2 දැනට දරන තනතුර : ..........................................................

6.3 සේවා කාලය : ..........................................................

6.4 ස්ථිර වැටුප් හිමි හෝ තාවකාලිකද යන බව : ..........................................................

6.5 රාජ්‍ය සේවයේ යෙදී සිට ඉන් ඉවත්ව ඇත්නම් ඊට හේතු : ..........................................................

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:
ii. ලදුපත් අංකය හා දිනය :
iii. ගෙවූ මුදල :

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

9.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.............................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ................................

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.
විභාග කොමසාරිස්

නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කරන ලදි. ඔහු /ඇය විසින් මෙහි අංක 04 සිට 06 දක්වා වන ශීර්ෂ යටතේ ලබා දී ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. මෙම තනතුරට අදාළ මූලික සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත්‍රය විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම / ප්‍රතික්ෂේප කිරීම නිර්දේශ කරමි.

.....................................................
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : ................................